**මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2021**

---

මහනුවර නාගරික අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්-පී 99 දරන ණය ගිවිසුමේ **III** ව්‍යවස්ථාවේ 4(6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජලසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහනුවර නගරයේ අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම හා බැහැර කිරීම සඳහා යෝග්‍ය ක්‍රමවේදයක් ගොඩනැංවීම මඟින් ජනාකීර්ණ ප්‍රදේශ වල සනීපාරක්ෂක පහසුකම් යළි නගා සිටුවීම, මහවැලි ගඟේ ජලයේ ගුණත්වය හා ජීවන පරිසරය උසස් කිරීම හා ඒ අනුව ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය, සෞඛ්‍ය හා සුබ සාධනය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,982 කට සමාන ජපන් යෙන් මිලියන 17,278 ක් වන අතර, ඉන් රු.මිලියන 17,922 කට සමාන ජපන් යෙන් මිලියන 14,087 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එකඟ වී තිබුණ අතර ඉතිරි මුදල වූ රු.මිලියන 4,060 කට සමාන ජපන් යෙන් මිලියන 3,191 ක් ශ්‍රී ලංකා රජය විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 03 දින ආරම්භ කර තිබුණු අතර 2017 සැප්තැම්බර් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලය 2022 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| මහා භාණ්ඩාගාරය විසින් 2021 දෙසැම්බර් 31 දින දක්වා සකසන ලද සමානතා ගැලපුම් (Parity adjustment) වටිනාකම රු.මිලියන 2,122.25 ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | එළඹෙන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි කිරීමට ක්‍රියා කරනු ඇත. | සමානතා ගැලපුම ගිණුම් ගත කිරීමට පියවර ගත යුතුය. |

## 3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 3.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| ෆිඩික් මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 14.7 ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් අතරමැදි ගෙවීම් බිල්පත් ලද දින සිට දින 56 ක් ඇතුළත නිරවුල් කළ යුතුය. කෙසේවුවද, කොන්ත්‍රාත් බිල් නිරවුල් කිරීම ප්‍රමාද වීම මත මූල්‍ය ගාස්තු ලෙස රු.මිලියන 4.5 ක් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | 2019 වර්ෂයේ අයවැය සැලසුමේ දක්වා ඇති පරිදි IPC ගෙවීම් සඳහා ජල සම්පාදන අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කරන ලද රු.මිලියන 5,763 ක අරමුදල් ලැබී නොතිබුණි. එම නිසා පැකේජ 02 යටතේ IPC 18,19 සහ පැකේජ 03 යටතේ IPC 20,21,22,23 යන බිල්පත් ගෙවීම ප්‍රමාද විය. | ක්‍රියාත්මක කිරීමේ හා ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය ලෙස ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ජල සම්පාදන අමාත්‍යාංශය ප්‍රමාදයකින් තොරව බිල්පත් නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 4 භෞතික කාර්යසාධනය

### 4.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම් | 2021 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| | අපේක්ෂිත කාර්යසාධනය | සත්‍ය කාර්යසාධනය | | |
| (අ) නිර්මාණ හා සැලසුම් කිරීම් | | | පූර්වයෙන් නිර්ණය කළ නොහැකි පහත ප්‍රමාදයන් (සේවා යෝජකට අදාල වන) නිම කිරීම් කෙරෙහි බලපාන ලදී. | කොන්ත්‍රාත් කාර්යය කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| – ප්‍රධාන අපවහන ජාලය | | | | |
| – කාණු සහිත (Open Cut) | කි.මී.6.23 | කි.මී.6.23 | | |
| – කාණු රහිත | කි.මී.2.87 | කි.මී.2.68 | – පයිප්ප ඇතිරීම් සඳහා ගැඹුරු කැණීම් සිදු | |

| | | | | |
|---|---|---|---|---|
| (Trenchless) | | | කිරීමේදී ඇති වූ ගැටළු හේතුවෙන් ප්‍රධාන පොම්පාගාර ස්ථානය ප්‍රතිස්ථාපිත කිරීමට සිදුවීම.<br>– මැද ඇළ හා ග්‍රිඩ් සිටි ජාතික ව්‍යාපෘති සමඟ සමායතනය කිරීම | |
| – ශාඛා අපවහන ජාලය | | | – ශ්‍රී දළදා වීදියේ පයිප්ප ඇතිරීමට එරෙහිව මහජන විරෝධය (සමාජ ගැටළු) | |
| – කාණු සහිත (Open Cut) | කි.මී.71.1 | කි.මී.73.6 | | |
| – කාණු රහිත (Trenchless) | කි.මී.5.7 | කි.මී.1.0 | | |
| – ගෘහස්ථ අපවහන ජාලය | | | – කොරෝනා 19 වසංගතය<br>– පූර්වයෙන් නිර්ණය කළ නොහැකි අමුද්‍රව්‍ය හිඟකම, රටෙහි ආර්ථික තත්ත්වය සමඟ සමගාමී වූ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය | |
| – කාණු සහිත | කි.මී.145.2 | කි.මී.156.7 | | |
| – කාණු රහිත | කි.මී.11.24 | කි.මී.2 | | |
| – ප්‍රධාන නලය | | | | |
| – කාණු සහිත (Open Cut) | කි.මී.3.18 | කි.මී.3.1 | | |
| – කාණු රහිත (Trenchless) | මීටර 173 | මීටර 17 | | |
| – මනු බිල් පොම්ප මධ්‍යස්ථානය (Manhole pump station) | 09 | 05 ක් ක්‍රියාත්මක අතර මනු බිල් පොම්ප මධ්‍යස්ථාන 04 ක් කෙරෙමින් පවතී. | | |
| (ආ) ගෘහස්ථ සම්බන්ධතා ඉදි කිරීම | 6,191 | 5,854 | කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය අවධාරණය කළ යුතු බව නිරීක්ෂණය විය. කෙසේවුවද,සේවායෝජකගේද පහත ප්‍රමාදයන් සිදු විය.<br>– දිගන සිදු වීම මත පැන වූ පොලිස් ඇඳිරි නීතිය නිසා කාර්යය අවහිර වීම.<br>– කොරෝනා 19 වසංගතය (ගමනාගමන අවහිරතා, | ව්‍යාපෘති කාර්යය කඩිනම් කිරීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| - ඉදි කිරීම | 3,297 | 2,724 | | |
| - සම්බන්ධතා ලබා දීම | | | | |

| | | |
|---|---|---|
| | | කොන්ත්‍රාත්කරුගේ වැඩබිම් කාර්ය මණ්ඩලයට කොවිඩ් 19 නිසා ඇති වූ බලපෑම සහ නිරෝධායනය සඳහා වැඩ බිම් කාර්යාලය දින 14 ක් වැසීම සංවරණ සීමා පැනවීම.) |

## 4.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| (අ) ව්‍යාපෘතිය අවසාන නොවුවද, ණය ආපසු ගෙවීම් 2020 වර්ෂයේ ආරම්භ කර තිබුණි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව ණය ආපසු අය කර ගැනීම් ලෙස 2021 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 1,644.78ක් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හා නියමිත වේලාවට කොන්ත්‍රාත් ප්‍රධානය සිදු නොකිරීම මත ණය නියෝජිතායතනයට ගෙවා තිබුණි. | ප්‍රමාදයන් සේවායෝජකගේ පාලනයෙන් බැහැර අතර අවසන් ගෙවීම් සඳහා හා අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීම සඳහා ණය උපයෝජන කාල සීමාව දීර්ඝ කිරීමට කාලීනව ක්‍රියා කර ඇත. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘති කාර්යය සාධනය කඩිනම් කිරීම සඳහා නොපමාව ක්‍රියාකළ යුතුය. |
| (ආ) දුර්වල ව්‍යාපෘති කළමනාකරණය සහ එකඟ වූ කාල රාමුව තුළ ණය උපයෝජනය සිදු නොකිරීම නිසා 2021 දෙසැම්බර් 31 දින දක්වා බැඳීම් ගාස්තු ලෙස රු.මිලියන 173.48 ක් ණය නියෝජිතායතනය විසින් අය කර තිබුණි. | කොන්ත්‍රාත් පැකේජ නිම කිරීමේ ප්‍රමාදය නිසා ණය උපයෝජන කාල සීමාව දීර්ඝ කිරීම අත්‍යාවශ්‍ය වේ. | ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘති කාර්යසාධනය වේගවත් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) ප්‍රධාන අපවහන ජාලය, ශාඛා අපවහන ජාලය සහ මනුබිල් පොම්පාගාර සැලසුම් කිරීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව යටතේ වූ කාර්යය සැලසුම් කිරීම ව්‍යාපෘතිය විසින් නිසි ලෙස ඇගයීම් කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස කොන්ත්‍රාත්කරු විසින් රු.මිලියන 1,750 ක් වූ විචලතා නියෝග ඉදිරිපත් කර තිබූ අතර ඉන් රු.මිලියන 52.12 ක් අතිරේක සැලසුම් පිරිවැය ලෙස ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | 4.1 (අ) හි දක්වා ඇති පරිදි ඉදිකිරීම් ප්‍රමාද වූ අතර අතිරේක පිරිවැය දැරීමට සිදු විය. කෙසේවුවද, කොන්ත්‍රාත්කරු රු.මිලියන 5,056 ක් ඉල්ලුම් කර තිබූ අතර කරන ලද ඇගයීම්වලින් පසු එය රු. මිලියන 1,750 දක්වා අඩු කර ගැනීමට හැකි විය. | ව්‍යාපෘතිය විසින් සැලසුම් කාර්යය මුල් අදියරේ දී ඇගයීම් කළ යුතුය. |

### 4.3 පරිබාහිර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘති විෂය පථයට පරිබාහිර වූ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ අපජල අපහරණ පිරියත මඟින් සබඳතා ලබා දීම් සඳහා ව්‍යාපෘතියේ සිටින කාර්ය මණ්ඩලය යොදවා තිබූ අතර දේපල සබඳතා ලබාදීමේ කොන්ත්‍රාත්තුව යටතේ ඒ සඳහා රු.මිලියන 13.02 ක් වැය කර තිබුණි. | මහනුවර අපජල අපහරණ පිරිපහදු පද්ධතියට පේරාදෙනිය විශ්වවිද්‍යාල ව්‍යාපෘතිය සම්බන්ධ කළ යුතු බැවින් ව්‍යාපෘතියේ පලපුරුද්ද සලකා එම ව්‍යාපෘතියේ කටයුතුද තාක්ෂණික හා සමාජ සුබසිද්ධිය මනාව කළමනාකරණය කිරීම උදෙසා මෙම ව්‍යාපෘතියටම ලබා දෙන ලදී. | ව්‍යාපෘති විෂය පථය තුළ වියදම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.4 මතභේදයට තුඩු දුන් කරුණු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනකගේ නිර්දේශ |
|---|---|---|
| මහනුවර අපජල අපහරණ ව්‍යාපෘතියේ පිරිපහදු පිරියත මාර්ගගත ක්‍රමය ඔස්සේ විවෘත කිරීම සඳහා ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 2.6 ක් වැය කර තිබුණි. | ශ්‍රී ලංකා රජයේ මහජන දැන ගැනීම් අවශ්‍යතාව සඳහා සිදු කරන ලදී. | ව්‍යාපෘතියේ වියදම් කාර්යක්ෂමව, ඵලදායීව හා ආර්ථිකව කළමනාකරණය කල යුතුය. |

### 4.5 පද්ධති හා පාලන

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 ජුලි 26 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 05 පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණකවරයෙක් බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලය ක්‍රියා කරන අතර 2019 වර්ෂයට අදාලව අභ්‍යන්තර විගණන අංශය විසින් ඉල්ලුම් කරන ලද ලේඛන අභ්‍යන්තර විගණන අංශයට ලබා දී නැත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ස්ථාවර වත්කම් භෞතිකව සත්‍යාපනය කිරීමට ක්‍රියා කල යුතුය. |

**4.6 පෙර විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද නොවිසඳුනු ගැටළු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| දෙයියන්වෙල පොම්පාගාර සහිත ඉඩමේ ඉදි කිරීම් නිම කර ඇති අතර මහාමයා ප්‍රාථමික විද්‍යාලයට ආසන්න පොම්පාගාරයේ ඉදිකිරීම් කෙරෙමින් පවතී. කෙසේ වුවද, ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා ගෙන නොතිබුණි. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | තව දුරටත් ප්‍රමාදවීමකින් තොරව ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |